**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය**
**2023 (2024)**
**44 - නැටුම් (දේශීය) I, II**
**I පත්‍රය**

**විභාග අංකය ............................................** **කාලය - පැය 3 යි**

**සැලකිය යුතුයි**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. ''ආංගිකම් භුවනම් යශ්‍ය වාචිකම් සර්ව වාන්මයම්....'' මෙමගින් ........ දෙවියන් නමස්කාර කෙරේ.
1. ක්‍රිෂ්ණ 2. රාධා 3. ලක්ෂ්මි 4. ශිව

02. ප්‍රශස්ති, වන්නම් හා හටන් කවි අයත් ජනගායනා විශේෂය ........................ ලෙස හැඳින්වේ.
1. යාග ගී 2. සේ ගී 3. ගැමි ගී 4. මෙහෙ ගී

03. ක්‍රෝධ නැමති ස්ථායි භාවයෙන් ජනිත වනුයේ....... රසයයි.
1. රෞද්‍ර 2. භයානක 3. අද්භූත 4 ශෘංගාර

04. ''පානා අසිරි නොහැර බානා දෙනෙත් කුසුම'' මෙය .............................. කවියකි.
1. හටන් 2. ප්‍රශස්ති 3. මෝල්ගස් 4. ගොයම්

05. කෝලම් නාටකයේදී ..................... අපර රංග වලට අයත් ය.
1. ජසයා 2. නාගරාක්ෂ 3. නොංචි 4. ආරච්චි

06. චරිතයට අවශ්‍ය පරිදි බාහිර ස්වරූපය වෙනස් කරන්නේ ................................. අංග රචනයෙනි.
1. සරල 2. විකාර රූපී 3. චරිතාංග 4. ශෛලිගත

07. භරත නර්තනයේ දී සංගීත ශිල්පීන් හා ගුරුවරුන් .......................... නමින් හඳුන්වනු ලැබේ.
1. නටුවනාර් හා සිංකිඩ් 2. මුත්තුකාරන් හා නටුවනාර්
3. මුත්තුකාරන් හා පත්තුකාරන් 4. නටුවනාර් හා පත්තුකාරන්

08. ''විදෙන ලෙලෙන නරුබර පුලුලුකුල රැදී'' යන කවිය අයත් වන්නේ ................ සංදේශයට ය.
1. හංස 2. තිසර 3. සැළලිහිණි 4. පරවි

09. ඓතිහාසික තොරතුරු අනුව දළඳා පෙරහැර මුල් වරට පවත්වන ලද්දේ ................ රජුගේ කාලයේදීය.
1. විමලධර්මසූරිය 2. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ
3. කීර්ති ශ්‍රී රාජසිංහ 4. කිත්සිරි මෙවන්

10. සමන් දේවාල පෙරහැරෙහි ................... දක්නට ලැබෙන සුවිශේෂී වූ නර්තන අංගයකි.
1. කසකරුවන් 2. ගිණිබෝලකරුවන් 3. මහබඹා කෝලම 4. කාවඩි නැටුම්

11. 

මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ

1. ජයසේන කෝට්ටේගොඩ මහතා ය
2. මුදියන්සේ දිසානායක මහතා ය
3. තිස්ස කාරියවසම් මහතා ය
4. ආරියරත්න කළුආරච්චි මහතා ය

12. බදුල්ල කලුන්දෑව ..... ආදී ප්‍රදේශවල සොකරි ගැමි නාටකය පැවැත්වීමේ දී වාදනය කරන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,

1. උඩැක්කියයි
2. ගැටබෙරයයි
3. දවුලයි
4. තම්මැට්ටමයි

13. ලාස්‍ය ලක්‍ෂණ වලින් යුතු ද්‍රවිඩ ගැමි නැටුම වන්නේ,

1. කුම්මි ය
2. චෙම්බු ය
3. කෝලාට්ටම් ය
4. අරිච්චෙට්ටු ය

14. ශාදී, නිරාෂා මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ශිල්පිණියකි.

1. උපේඛා චිත්‍රසේන
2. මිරැන්ඩා හේමලතා
3. වජිරා චිත්‍රසේන
4. අංජලිකා චිත්‍රසේන

15. පරාක්‍රම බාහු රජුට කොහොඹා කංකාරියක් කළ බව සඳහන් වන්නේ,

1. සිහබා අස්නෙහිය
2. චූල වංශයෙහිය
3. කුවේණි අස්නෙහිය
4. මහා වංශයෙහිය

16. කෝලම් ගැමි නාටක උපත්කථාවෙහි සඳහන් චරිතයකි

1. මහාසම්මත රජු
2. සේරමානි රජු
3. සංඛපාල රජු
4. මලය රජු

17. කරදිය මුද්‍රා නාට්‍යයේ සංගීත නිර්මාණය හා රංගවස්ත්‍ර නිර්මාණය කරන ලද්දේ


1. අමරදේව මහතා හා ලයනල් අල්ගම මහතා විසිනි
2. ලයනල් අල්ගම මහතා හා සෝමබන්දු විද්‍යාපති විසිනි
3. ලයනල් අල්ගම මහතා හා මහින්ද ඩයස් මහතා විසිනි
4. අමරදේව මහතා සහ චිත්‍රසේන ඩයස් මහතා විසිනි


18. භරත නාට්‍යම් හා කතක් නර්තන සම්ප්‍රදායන්හි ප්‍රවර්ධනයට කටයුතු කළ ශිල්පීන් වන්නේ,


1. මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි සහ නවාබ් වජීද් අලීෂා
2. අච්ජන් මහාරාජ් හා කල්කා ප්‍රසාද්
3. බිර්ජු මහාරාජ් සහ වල්ලතෝල් නාරායන මෙනන්
4. උදය ශංකර් සහ නවාබ් වජීද් අලීෂා

❖ 19 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත දැක්වෙන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A


B


C


D

19. ශාප්මෝචන් මුද්‍රා නාට්‍ය නිර්මාණකරු දක්නට ලැබෙන ඡායාරූපයට හිමි අක්ෂරය වන්නේ

1. B ය
2. A ය
3. C ය
4. D ය

20. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණ ශිල්පීන් දක්නට ලැබෙන ඡායාරූප වන්නේ

1. A හා B ය
2. C හා D ය
3. A හා C ය
4. A හා D ය

21. රිම් දැහිම් ගුද ගුද දැහිං පදයට සබයට පිවිසෙන්නේ,

1. මුදලි ය    2. ජසයා ය    3.නොංචි ය    4.අණබෙරකරු ය

22. පතුරු, ගොයම් හා මෝල්ගස් යන ගැමි නැටුම් වේදිකාවට සුදුසු ලෙස නිර්මාණය කළ නිර්මාණකරුවන් දක්නට ලැබෙන්නේ පිළිවෙලින්,

1. ජයසේන කෝට්ටේගොඩ මහතා, පණීභාරත මහතා හා මිරැන්ඩා හේමලතා මහත්මිය
2. පණීභාරත මහතා, පියසාර ශිල්පාධිපති සහ චිත්‍රසේන මහතා
3. පියසාර ශිල්පාධිපති, පණීභාරත මහතා සහ මිරැණ්ඩා හේමලතා මහත්මිය
4. චිත්‍රසේන මහතා, පණීභාරත මහතා හා වජිරා චිත්‍රසේන මහත්මිය

❖ 23 - 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | දුන්න | වීරමුණ්ඩ දෙවි | පඬුවස්දෙව් රජු | ගෝනා |
| 2 | පත්තිනි දෙවි | සේරමානි රජු | දෙවොල් දෙවි | වාහල දෙවි |
| 3 | ඌරා | නවකොළ අත්ත | පොල්මල | මුගුර |
| 4 | මළය රජු | ඊ ගස | කොතලය | වංගෙඩිය |

23. දෙවොල් මඩු ශාන්ති කර්මයේ පුදලබන්නන් දක්නට ලැබෙනුයේ

1. 2 පේළියේ A හා C ය    2. 1 පේළියේ B හා 2 පේළියේ C ය
3. 1 පේළියේ B හා 2 පේළියේ D ය    4. 4 පේළියේ A හා 2 පේළියේ C ය

24. පහන් මඩු ශාන්තිකර්ම පුරාවෘත කථාවට අදාළ චරිත දක්නට ලැබෙන්නේ,

1. 2 පේළියේ B හා 4 පේළියේ A ය    2. 1 පේළියේ B හා C ය
3. 1 පේළියේ D හා 2 පේළියේ B ය    4. 2 පේළියේ B හා 1 පේළියේ D ය

25. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ වනේයක්කමේ දී භාවිත රංග භාණ්ඩ ඇත්තේ,

1. 1 පේළියේ A හා 3 පේළියේ D ය    2. 3 පේළියේ B හා D ය
3. 1 පේළියේ A හා 4 පේළියේ D ය    4. 3 පේළියේ B හා 4 පේළියේ D ය

26. උඩරට පහතරට හා සබරගමු සම්ප්‍රදායන්ට අයත් නාට්‍යමය පෙළපාලි පිළිවෙලින් වන්නේ,

1. කොහොඹා හෑල්ල, අබ විද්මන, රාමා යක්කම
2. ඌරා යක්කම, ඇත් බන්ධනය, අබ විද්මන
3. දෙවොල් ගොඩ බැසීම, නයා යක්කම, පොත්කඩේ පාළිය
4. ගබඩා කොල්ලය, දෙවොල්ගොඩබැසීම, පොත්කඩේ පාළිය

27. බලි ශාන්ති කර්මයේ දී භාවිත තාල වාද්‍ය භාණ්ඩයකි.

1. ගැටබෙරය    2. උඩැක්කිය    3. අත්මිණිය    4. දවුල

28. ''හෙට්ටිරාල බැහැ දැක සැලකළ විට'' මෙම කවිය භාවිත වන්නේ,

1. සොකරි ගැමි නාටකයේ ය    2. කොහොඹා කංකාරියේ ය
3. කෝලම් ගැමි නාටකයේ ය    4. දෙවොල් මඩුවේ ය

29. දළදා පෙරහැරට සහභාගී වූ සියළු දෙනාගේ වස් දොස් දුරු කිරීම සඳහා දින හතක් පවත්වනු ලබන ශාන්ති කර්මය වන්නේ.

1. කඩවර කංකාරිය 2. වළියක් මංගල්‍යය 3. ගරා යකුම 4. කොහොඹා කංකාරිය

30. ''දෙවුන්දර උපුල්වන් දේවාලයේ දෙවියන් ඉදිරියේ හින්දු බාලිකාවන් පන්සීයක්.... '' යන මෙම දේශාඨන වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ.

1. ස්ෆීල් බර්ජන් විසිනි 2. රොබට් නොක්ස් විසිනි 3. ඉබන් බතූතා විසිනි 4. ජෝන් ඩේවි විසිනි

31. දොං ජිංත ගත දොංත වට්ටමට අදාළ තාල රූපය වනුයේ

1. මාත්‍රා 2 + 3 ය 2. මාත්‍රා 2 + 4 ය 3. මාත්‍රා 3 + 3 ය 4. මාත්‍රා 4 + 4 ය

32. ''සුරිඳුන් පෙර සිටන් බලයුත් සැවතිඳුන්'' මෙම ගායනය අන්තර්ගත වන්නම වන්නේ,

1. සිංහරාජ 2. සැවුලා 3. නෛයඩි 4. තුරගා

33. පස්වන පා සරඹයේ සහ දහවන ගොඩ සරඹයේ සරඹනාම වන්නේ.

1. දෑලඅඩිය හා චන්ද්‍රිකා සරඹය 2. නුහුරු අඩිය හා බඹර සරඹය
3. දෑලඅඩිය හා බඹර සරඹය 4. කරණම් අඩිය හා පැනීම් සරඹය

34. ගැටබෙරයෙහි වරපටි වලට හා දකුණු ඇසට සුදුසු හම් වර්ගය පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ.

1. හරක්හම් හා බොකුහම් 2. මුවහම් හා හරක් හම්
3. එළුහම් හා මුවහම් 4. හරක්හම් හා මුවහම්

35. තාක්කු තක්කුං ............... තකුද තත්ජෙං ............ තජෙං මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට සුදුසු පද කොටස ඇතුළත් වරණය තෝරන්න.

1. තරිකිට, ජෙංතා 2. තරිකිට, තත්ජෙං 3. තක්කඩ, තකුද 4. ජෙංත, තජෙං

36. උඩරට දහඅට වන්නම් රචනා කරන ලද යුගය වන්නේ,

1. මහනුවර 2. කෝට්ටේ 3. දඹදෙණි 4. ගම්පොළ

37. ගැටබෙරයෙන් වයන මැදුම් මහ දෙතිතට අයත් බෙර පදයකි.

1. දොං දොං ජිං ජිං ගජිගත 2. දොං ජිංත ගත දොංත
3. දෝං ජිංජිං තකට දොංතක 4. දොදොංත තකුදොං

38. ''අත්‍යා බෙර වාදනය'' දක්නට ලැබෙන්නේ,

1. පහන් මඩු ශාන්තිකර්මයේ ය 2. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ය
3. දෙවොල් මඩු ශාන්තිකර්මයේ ය 4. කිරිමඩුව ශාන්ති කාර්මයේ ය

39. උඩරට නර්තනය හදාරන ආධුනික ශිල්පියෙකු තනිකච්චි ඇඳුමෙන් සැරසී නර්තනය කරනු ලබන නර්තනාංග වන්නේ,

1. අස්නෙ හා ආවැන්දුම 2. පන්තේරු හා උඩැක්කි
3. තාලම් හා ලී කෙළි 4. ගොයම් හා තාලම්

40. ''දොංතකු දොංතකු දොං ජිං ගත් තත් ජිං තරිකිට'' මෙහි තාල රූපය වන්නේ

1. මාත්‍රා 2 + 3 ය 2. මාත්‍රා 2 + 4 ය
3. මාත්‍රා 2 + 2 + 3 ය 4. මාත්‍රා 2 + 2 + 4 ය

## නැටුම් (දේශීය) - II පත්‍රය

- **පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.**

---

**01. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුර ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

I. උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ හා සමානව සබරගමු නර්තන සම්ප්‍රදායේ දී .................. නර්තනය කරනු ලැබේ.

II. රජයේ පාසල්වල සෞන්දර්ය විෂයය අනිවාර්යය කරන ලද්දේ ....................... දී ය.

III. උඩැක්කියේ සම්මත දිග ........................... කි.

IV. සුරඹා වල්ලිය ............................... මහතා විසින් වේදිකාවට සුදුසු ලෙස නිර්මාණය කරන ලදී.

V. ගද්‍ය හා පද්‍ය කොටස් දෙකකින් සමන්විත ජන ගායනා විශේෂයක් ලෙස ........................... ලෙස හැඳින්විය හැකිය.

VI. භාතිකාභය රජු ස්තූප පූජා සඳහා නැටුම් ගැයුම් වැයුම් වලින් පූජා පැවැත් වූ බව .................. සඳහන් වේ.

VII. මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍ය ......................... වේ.

VIII. ‘සිංහල ගැමි නාටකය’ ග්‍රන්ථය .......................... මහතා ගේ කෘතියකි.

IX. ‘‘කිරීටම්’’ සහ ‘‘කොක්තුම්බි’’ ආභරණ පළඳින විදේශීය නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.
අ) කිරීටම් :-
ආ) කොක්තුම්බි :-

X. ‘‘සකපෝරුව’’ හා ‘‘ඉල්ලම් ගැරීම’’ භාවිත කර්මාන්ත දෙක නම් කරන්න.
අ) සකපෝරුව :-
ආ) ඉල්ලම් ගැරීම :-

02.

I. සිංහරාජ වන්නමට අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න.

II. කොකුම් පාට කිතුලින් බත් වළඳා ඉඳුරට හිමි වන
අතින් රැගෙන සිරි වසකුත් තුරඟුත් නැගි ඉඹුල් විමන
මෙම කවි පද දෙක මාත්‍රා 3 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

III. මුසලඩි වන්නමට අයත් අඩව්ව ප්‍රස්තාර කරන්න.

03. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

I. මිරැන්ඩා හේමලතා මහත්මිය

II. හටන් කවි

III. සමන්දේවාල පෙරහැර

IV. තුන්තිතේ ප්‍රභේද

V. නර්තන කලාව හා බැඳි සාරධර්ම

04. දේශීය ශාන්තිකර්ම පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී විවිධ අංග තුළින් පෝෂණය වී ඇති බව පැහැදිලි වේ.

I. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ගායනා සහිත නර්තන අංග දෙකක් හා ගායනා රහිත නර්තන අංග දෙකක් නම් කරන්න.

II. සබරගමු පහන්මඩු ශාන්ති කර්මයේ නාට්‍යමය අවස්ථා දෙකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

III. පහතරට දෙවොල්මඩුව ශාන්ති කර්මයේ පුරාවෘත්ත කථාව ඇසුරින් සන්නිවේදනය කරන්නා වූ ආගමික පසුබිම පිළිබඳ විග්‍රහයක් කරන්න.

05.

I. සොකරි නාටකයේ එන කාන්තා චරිත දෙකක් හා පිරිමි චරිත දෙකක් නම් කරන්න.

II. සොකරි රගමඩල හා කෝලම් රංගමඩල පිළිබඳ විස්තරයක් කරන්න.

III. කෝලම් නාටකයේ එන ජස විදානෙගේ චරිත නිරූපණය තුළින් පිළිබිඹු වන රසභාවයන් පිළිබඳ විග්‍රහයක් කරන්න.

06.



A B



C



D

I. A සහ B රූපවල දැක්වෙන නර්තන සම්ප්‍රදායයන් සහ ඊට අදාළ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙක නම් කරන්න.

II. C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ භාවිත රංග වස්ත්‍රාභරණ නම්කර ඉන් දෙකක් පිළිබඳ විස්තර කරන්න.

III. D රූපයේ දැක්වෙන රූපවාහිනී නර්තන ඇසුරෙන් වේදිකාවක භාවිත තාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

07. මානසික හා ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීමට නර්තන ක්‍රියාකාරකම් ඉවහල් වේ.

I. මානසික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා නර්තන ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන හැකියා පෙළ ගස්වන්න.

II. නර්තනය තුළින් ඉවසීමේ ගුණය ප්‍රගුණ වේ. මෙය නිදසුන් සහිතව විස්තර කරන්න.

III. නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කර ගත හැකි ශාරීරික කුසලතා පිළිබඳ අගයමින් කෙටි සටහනක් ලියන්න.

# පිළිතුරු පත්‍රය - II කොටස

02. I.

| $1'$ | 2 | 3 | 4 | $1'$ | 2 | 3 | 4 | $1'$ | 2 | 3 | 4 | $1'$ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දො | දොං | - | ත | ත | කු | දොං | - | දො | දොං | - | ත | ත | කු | දොං | - |

(ලකුණු 04)

තාල සංකේත භාවිතයට - ලකුණු 02
බෙරපදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

02. II.

| $1'$ | 2 | 3 | $1'$ | 2 | 3 | $1'$ | 2 | 3 | $1'$ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කො | කුම් | - | පා | - | ට | කි | තු | ලින් | - | බත් | - |
| ව | ළ | ඳා | - | ඉ | ඳු | ර | ට | හි | මි | ව | න |
| අ | ත්‍රින් | - | රැ | ගෙන | න | සි | රි | ව | ස | කුත් | - |
| තු | ර | ගුන් | - | නැ | ඟි | ඉ | ඹුල් | - | වි | ම | න |

(ලකුණු 04)

තාල සංකේත භාවිතයට - ලකුණු 02
කවිපද ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

02. II.

| $\hat{1}$ | 2 | 3 | $1'$ | 2 | 3 | 4 | $\hat{1}$ | 2 | 3 | $1'$ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ද | තජ් | - | ජේං | - |
| + | + | + | තත් | - | ජේං | - | ත | ජේං | - | තජ් | - | ජේං | - |
| ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ද | තජ් | - | ජේං | - |
| + | + | + | තත් | - | ජේං | - | ත | ජේං | - | තජ් | - | ජේං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ද | තජ් | - | ජේං | - |
| ජී | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ද | තජ් | - | ජේං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ජී | - | කු | ජික් | කුං | තරි | කිට |
| ත | කු | ද | තත් | - | ජේං | - | + | + | + | තත් | - | ජේං | - |
| ත | ජේං | - | තත් | - | ජේං | - | + | + | + | ජේං | - | තා | - |
| ජේ | තා | - | ජේ | ත | කු | ද | ජේං | - | ත | තා | | | |

(ලකුණු 04)

තාල සංකේත භාවිතයට - ලකුණු 02
අඩව්ව ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

මුළු ලකුණු - 12

03.

I. මිරැන්ඩා හේමලතා මහත්මිය

- ❖ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රථම නර්තන අධ්‍යක්ෂිකා තනතුර දැරූ බව.
- ❖ සුසමාහිත පෞරුෂයක් ඇති දරු පරපුරක් බිහි කිරීමට වැඩ සටහන් ක්‍රියාත්මක කල බව.
- ❖ භරත නාට්‍ය ශිල්පිණියක් ලෙස කටයුතු කර ඇති බව.
- ❖ මන්ද මානසික දරුවන්ගේ නර්තන කුසලතා ඔප් නැංවීමට කටයුතු කල බව.
- ❖ 1985 දී සොන්ටා ජාත්‍යන්තර සම්මානය හිමි කර ගත් බව.
- ❖ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ධූරය දැරූ බව.
- ❖ රංගධාරා, රංග රේඛා .... ආදි නර්තන ප්‍රසංග කල බව.
- ❖ 1980 වර්ෂයේ දී මෝල්ගස් නැටුම නිර්මාණය කල බව ආදී ......... කරුණු තුලින් හතරක් ලියා විස්තර කිරීමට.

(ලකුණු 04)

II. හටන් කවි

- ❖ පැරණි රාජධානි සමයේ පැවති සටන් පසුබිම් කරගෙන ගොඩනැගී ඇති කවි විශේෂයක් බව.
- ❖ යුද්ධ කරන අවස්ථාවේ හා යුද්ධයෙන් පසු අවස්ථා පසුබිම් කරගෙන ගායනා රචනා වී ඇති බව.
- ❖ වීරත්වය පසුබිම් කරගෙන ඇතිබව.
- ❖ විවිධ නාද මාලා භාවිත කරන බව.
- ❖ උදාහරණ ලියා තිබීම. (ලන්දේසි හටන, පෘතුගීසි හටන)
- ❖ කවි ලියා තිබීම.
  ආදී කරුණු හතරක් තුලින් පිළිතුර ලියා තිබීම.

(ලකුණු 04)

III. සමන් දේවාල පෙරහැර

- ❖ රත්නපුර සමන් දේවාලයේ වාර්ෂිකව සෞන්දර්යාත්මක වටිනාකමින් යුතු සංස්කෘතික අංගවලින් සමන්විතව පවත්වනු ලබන පෙරහැරක් බව.
- ❖ කුඹල් පෙරහැර, දෙවේලේ පෙරහැර හා රන්දෝලි යනුවෙන් පෙරහැර තුනකින් සමන්විත වන බව.
- ❖ පෙරහැර අලංකාර කර ගැනීම සඳහා යොදාගත් මෙවලම්, අලි ඇතුන්, සැරසිලි ඇතුලු විවිධාංග නිසා එහි චමත්කාරය වැඩි වන බව.
- ❖ මහ බඹා කෝලම මෙම පෙරහැරරේ දක්නට ලැබෙන විශේෂ අංගයක් බව.
- ❖ විවිධ චාරිත්‍ර සිදු කෙරෙන බව ආදී කරුණු තුලින් පිළිතුර ලියා තිබීම.

(ලකුණු 04)

IV. තුන්තිතේ ප්‍රභේද

- ❖ මාත්‍රා 2, 3, 4 තනිතිතේ ප්‍රභේද මුල්කරගෙන තුන්තිතේ තාලරූප ගොඩ නැගී ඇති බව.
- ❖ තිත් රූප තුනක් එකතු වීමෙන් තුන්තිත ගොඩ නැගී ඇති බව.
- ❖ තුන්තිතේ ප්‍රභේද දෙකක් ඇති බව
  1. දෙසුළු මැදුම් තුන්තිත
  2. දෙසුළු මහ තුන්තිත.
- ❖ මේ සඳහා උදාහරණ සහිතව ලියා තිබීම

(ලකුණු 04)

V. නර්තන කලාව හා බැඳි සාරධර්ම

- ❖ නර්තනය මගින් ඉවසීම, දැරීම, සමානාත්ම සංකල්පය නායකත්වයට ගරු කිරීම එකමුතුව වැඩ කිරීම... ආදී වටිනාකම් රාශියක් ජීවිතයට එකතු කර ගත නැති බව.
- ❖ ජීවිතයේ දී හමුවන අභියෝග වලට මුහුණ දිය හැකි බව.
- ❖ ගුරුවරුන්ට සහ වැඩිහිටි පරම්පරාවට ගරු කිරීම.
- ❖ නර්තන ගුරුවරයාට ආරම්භයේ දී හා අවසානයේ දී වැඳීම.
- ❖ ශාන්ති කර්ම සිදු කිරීමේ දී එම භූමියේ සිදු කෙරෙන සාරධර්ම
  කරුණු හතරක් තුලින් පිළිතුර ලියා තිබීම

(ලකුණු 04)

මාතෘකා තුනක් ලිවීමට මුළු ලකුණ - 12

04.

I. ගායනා සහිත
කොහොඹාහෑල්ල
අස්නය
මඩුපුරය සහිත මල්හත් පදය

ගායනා රහිත
දුණුමාලප්පුව, යක්කුන්පදය
යක් ඇනුම, හත්පදය
ආවැන්දුම
ඉන් දෙක බැගින් දක්වා ඇත්නම්

(ලකුණු 04)

II. පොත්කඩේ යක්කම, රාම මැරීම, මරා ඉපැද්දීම, අඹවිදමන ආදී නාට්‍යමය අවස්ථා දෙකක් ගෙන ඉන් නිරූපණය කෙරෙන අවස්ථා විස්තර කර ඇත්නම් ඉන් ප්‍රකාශවන රසභාවයන් පිළිබඳ විස්තර කර ඇත්නම්

(ලකුණු 04)

III. පංචශීලය හා ආගමික සංකල්ප ඇසුරින් පුරාවෘත්තය හා බැඳි සිද්ධි විස්තර කර තිබීම.
පලිගැනීම, ක්‍රෝධය, වෛරය, සත්ව හිංසනය, ආත්මාර්ථකාමීබව ආදිය කථා පුවත හා සසඳමින් විස්තර කර ඇත්නම්

(ලකුණු 04)

05.

I.

| කාන්තා චරිත | පිරිමි චරිත |
|---|---|
| කාලි | ගුරු හාමි |
| සොකරි | වෙදරාල |
| | පරයා |

(ලකුණු 04)

II. සොකරි
කමත රංගභූමිය ලෙස යොදා ගැනෙබව. ගෙඩි සහිත අඹ අත්තක්, කමත මැද වංගෙඩියක් මුනින් අතට තබා ලන්තෑරුම ඒ මත තබා ඇති බව, පහන් පැල සකසා ඇති බව ප්‍රේක්ෂකාගාරය ගොප් රැහැන් ඇද වෙන්කර ඇති බව දක්වා තිබීම.

කෝලම්
තානායම්පල බව, වෙස් අත්ත යොදන බව, පහන්පැල් සකසන බව ගොප් කොල රැහැන් ඇද ප්‍රෙක්ෂකාගාරය වෙන් කරන බව, බුරුල්ල ගොරොක් අතු ගොප් අතු යොදා සැරසිලි කරන බව දක්වා ඇත්නම්.

(ලකුණු 04)

III. හාස්‍ය රසය, ශෘංගාර රසය උද්දීපනය වන ලෙස රංගනයේ යෙදෙන බව. ඒ සඳහා බෙරපද (ගුං දැහිං……) කවි ගායනා, යොදා ගනිමින් රංගනයේ යෙදෙන විට මහත් පිටුබලයක් ලැබෙන බව දක්වා තිබීම.

(ලකුණු 04)

06.

I. $A$ – කථක් නර්තන සම්ප්‍රදාය
වාද්‍ය භාණ්ඩය - තබ්ලාව
$B$ – භරත නර්තන සම්ප්‍රදාය
වාද්‍ය භාණ්ඩය - මෘදංගය

(ලකුණු 04)

II. මණිපුරි නර්තන සම්ප්‍රදාය බව හඳුනාගෙන තිබීම.

කුමීන් කොක්තුම්බි
පොශ්වාන් කුදොස්
ක්වංගොයි රිෂම් පුරිට්
කුණ්ඩලානි
මයිකුම් ආදී....

රංග වස්ත්‍රාභරණ නම් කර ඉන් දෙකක් විස්තර කිරීමට.

(ලකුණු 04)

III. අධිවේගී/ මන්දවේගී දර්ශන

- ප්‍රතිබිම්බ නිර්මාණය
- දුරස්ථ දර්ශන
- සමීප දර්ශන
- ගායනය, වාදනය සඳහා තාක්ෂණික ක්‍රම ශිල්ප යොදා ගැනීම
- ආලෝකකරණය
- තාක්ෂණික ක්‍රම ශිල්ප තුලින් රංගවස්ත්‍රාභරණ වල සිදුවන වෙනස්කම් ආදී කරුණු හතරක් ඇසුරෙන් පිළිතුර ලියා තිබීම.

(ලකුණු 04)

මුළු ලකුණු 12

07.

I.
- බෙදා හදා ගැනීම
- සහයෝගය
- නීති රීති පිළිපැදීම
- නායකත්වයට ගරු කිරීම
- ජය පරාජය සම සිතින් පිළිගැනීම
- තර්කානුකූල චින්තනය ආදී

කරුණු හතරක් ලියා තිබීම

(ලකුණු 04)

II.
- නර්තනය හා සම්බන්ධ ආචාරධර්ම ප්‍රගුණ කිරීම
- නර්තනයේ දී අභ්‍යාස වල යෙදීම
- ලය පවත්වා ගැනීම
- නායකත්වයට අවනත වීම
- ගායනය හා වාදනයට අනුව නර්තනයේ යෙදීමෙන් ඉවසීම ප්‍රගුණ වීම ආදී කරුණු දක්වා තිබේනම්

(ලකුණු 04)

III.
- නම්‍යතාවය ඇතිවීම
- අංග, ප්‍රත්‍යංග, උපාංග මනා පාලනයකින් ඉවසීමෙන් යුතුව ක්‍රියා කරවීමෙන් මනෝචාලක ක්‍රියාකාරිත්වය වර්ධනය වන බව
- විවිධ චලන කිරීමට හැකියාව ලැබීම
- ශරීරයේ පේශි ශක්තිමත් වීම
- රුධිර නාල පද්ධතිය ක්‍රමවත් වීම
- තාලයට නර්තනය කිරීමේ හැකියාව
- නිරෝගී වීම ... ආදී කරුණු තුලින් සටහනක් ලියා ඇත්නම්

(ලකුණු 04)

මුළු ලකුණු 12

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය**
**2023 (2024)**
**44 - නැටුම් (දේශීය) I, II**
**පිළිතුරු පත්‍රය (2023) 2024**

---

**I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 01 | 4 |
| 02 | 2 |
| 03 | 1 |
| 04 | 2 |
| 05 | 2 |
| 06 | 3 |
| 07 | 2 |
| 08 | 3 |
| 09 | 4 |
| 10 | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 11 | 3 |
| 12 | 3 |
| 13 | 2 |
| 14 | 3 |
| 15 | 3 |
| 16 | 1 |
| 17 | 2 |
| 18 | 1 |
| 19 | 1 |
| 20 | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 21 | 2 |
| 22 | 3 |
| 23 | 1 |
| 24 | 4 |
| 25 | 4 |
| 26 | 4 |
| 27 | 3 |
| 28 | 1 |
| 29 | 2 |
| 30 | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 31 | 1 |
| 32 | 2 |
| 33 | 3 |
| 34 | 4 |
| 35 | 2 |
| 36 | 1 |
| 37 | 3 |
| 38 | 2 |
| 39 | 2 |
| 40 | 3 |

**II පත්‍රය**

01.

I. දොඹින පද

II. 1972

III. එක් වියත් තුනගුලකි

Iv. කේ.එස්. ප්‍රනාන්දු

V. ටීකා සී පද

VI. දීප වංශයේ

VII. පැරකුම්බා සිරිත

VIII. එදිරිවීර සරත්චන්ද්‍ර

IX. අ. කිරිටම් - කතකලී

ආ. කොක්තුම්බි - මණිපුරි

X. අ. සකපෝරුව - මැටිකර්මාන්තය

ආ. ඉල්ලම් ගැරීම - පතල් කර්මාන්තය